# මුහුදේ පාවෙන රාජ්‍යතන්ත්‍රික සබඳතා

## පෝක් සමුද්‍ර සන්ධි කලාපයේ ධීවර කටයුතු පිළිබඳ ගැටළුව: අපි ඉන්දියාවෙන් පාඩමක් ඉගෙන ගනිමු ද?

බර්නාඩ් ගුණතිලක විසිනි
(විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ පාත් ෆයින්ඩර් පදනමේ සභාපති)

අසල්වැසි රටවල් එකිනෙකා සමග හිතෛෂී සම්බන්ධතා පවත්වාගැනීම වටනා කරුණකි. විශේෂයෙන්ම, ස්වභාවික සම්පත් හවුලේ බෙදාහදාගැනීමට භූගෝලීය පිහිටීම විසින් ඔවුන්ට බලකර ඇත්නම් හිතෛෂී සම්බන්ධකම වඩාත් වටනේය. ස්වභාවික සම්පත් හවුලේ බෙදාගැනීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ නීති විශාරදයින් විසින් කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්ති, එක්සත් ජාතීන්ගේ 1979 මහා සමුළුවේදී සම්මත කරගන්නා ලදී (Res.. 34/186). එහි අඩංගු මාර්ගෝපදේශ පද්ධතියේ තුන්වන නියමයෙහි මෙසේ සඳහන් වේ.

*"සිය පාරිසරික නීතීන්ට අනුකූලව තමන් සතු ස්වාභාවික සම්පත්වලින් ඵල ප්‍රයෝජන ලබාගැනීමේ පරම අයිතිය රටවල් සතුය. එමෙන්ම, සිය බල ප්‍රදේශය හෝ පාලන ප්‍රදේශය තුල සිදුකරන ක්‍රියාකාරකම් නිසා වෙනත් රටවලට අයත් පරිසර පද්ධතීන්ට හෝ සිය ජාතියේ බලප්‍රදේශ සීමාවෙන් පිටත ප්‍රදේශවල පරිසර පද්ධතීන්ට හානි සිදුනොකිරීමේ වගකීම ද ඔවුන් දැරිය යුතුය."*

ශ්‍රී ලංකාවේ සහ එහි ළඟම අසල්වැසියා වන ඉන්දියාවේ ධීවර කර්මාන්තය ජීවනෝපාය කරගත් පිරිසකට ස්වභාවික සම්පත් හවුලේ භාවිතකිරීමේ කාරණය මතභේදයට තුඩුදෙන දැවෙන ගැටළුවක් වී ඇත. ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ මසුන් ඇල්ලීමේ යෙදුනු ඉන්දීය ධීවරයින් අත්අඩංගුවට ගැනීම පිළිබඳව මෑත කාලයේදී විදේශීය මෙන්ම දේශීය ජනමාධ්‍යවලට නිරන්තරයෙන්ම ප්‍රවෘත්ති මැවූ කරුණක් විය.

- ධීවරයින් අත්අඩංගුවට ගැනීම සාකච්ඡාවලට බාධාවක් විය හැකියි: තමිල්නාඩු මහ ඇමති මෝදිට කියයි. (ඉන්දියා ටී වී 2015 අප්‍රේල් 15)
- දිගින් දිගටම ශ්‍රී ලංකාව විසින් අත්අඩංගුවට ගැනීම පිළිබඳව තමිල්නාඩු ධීවරයෝ විරෝධතා දක්වති (ගාඩියන්, 2015 අප්‍රේල් 11)
- සාකච්ඡා ඇරඹීමට පෙර අත්අඩංගුවට ගත් ධීවරයින් නිදහස් කරන්න; තමිල්නාඩු මහ ඇමති මෝදිට ලියයි. (එන්ඩීටීවී 2015 මාර්තු 23)
- අත්අඩංගුවේ සිටින ධීවරයන් නිදහස් කරගැනීමට තමිල්නාඩු මහඇමති අගමැති ගේ මැදිහත්වීම සොයයි. (අවුට් ලුක් 2014 දෙසැම්බර් 10)
- ධීවරයින් නිදහස් කරගැනීමට තමිල්නාඩුව මෝදිගේ මැදිහත්වීම සොයයි. (හින්දුස්ථාන් ටයිම්ස් (2014 නොවැම්බර් 24)
- ධීවර ගැටළුව සම්බන්ධයෙන් ජයලලිතා අගමැතිට ලියයි: නිත්‍ය විසඳුමක් අවශ්‍ය බව කියයි. ( ද හින්දු 2014 ජුනි 8)

මේ පුවත් වාර්තා සියල්ල ඉතාමත් මෑත කාලීන නමුදු, ඒවාට පාදක වූ කරුණ අළු යට සැඟවුනු ගිනිපුපුරක් මෙන් දශක කිහිපයක් තිස්සේම පැවතුනු ප්‍රශ්නයකි. එහෙත් දෙරටේ අදාල බලධාරීහු එවැනි ප්‍රශ්නයක් නැත්තාක් මෙන් මගහැර සිටියහ. පුදුමය නම්, තමිල්නාඩු ද්‍රවිඩ ධීවරයන්ගේ පමණක් නොව ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල බහුතරයක් ද්‍රවිඩ ජාතිකයන් වූ ධීවරයන්ගේ ජීවිකා වෘත්තියට බලපෑම් කරන මේ ගැටළුවට විසඳුමක් සොයන්නට දෙරටම අවශ්‍යතරම් කැපවීමක් නොපෙන්වීමයි.

ශ්‍රී ලාංකාවේ ජාත්‍යන්තර මුහුදු සීමාවෙන් එපිට පෝක් මුහුදු බොක්කේ ධීවර කර්මාන්තයේ යෙදෙන ඉන්දියානු ධීවර යාත්‍රා ශ්‍රී ලංකා නාවුක හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා බවට ඉන්දියානු ධීවරයන්ගෙන් සහ තමිල්නාඩු දේශපාලකයන්ගෙන් නිරන්තරයෙන් චෝදනා එල්ල කර ඇත. මෙයින් ඔවුන් හගවන්නට තැත්කරනුයේ, එම අත් අඩංගුවට ගැනීම් සිදුකරනු ලබන්නේ ඉන්දියාවට අයත් මුහුදු සීමාව ඇතුලත බවයි. මේ චෝදනාව කිසිසේත්ම ඇදහිය නොහැක්කකි. එහි සත්‍යයක් නොමැති බව ඉන්දියානු වෙරළාරක්ෂක සේවාව විසින් ද තහවුරු කර ඇත.
(http://www.thehindu.com/news/cities/Madurai/article2633760.ece)

තවත් අවස්ථාවලදී මේ පිරිස් තමන්ගේම ප්‍රකාශවලට පරස්පරව කතාකරමින්, ඉන්දියානු ධීවරයන් අත් අඩංගුවට ගනු ලබන්නේ ශ්‍රී ලංකාවට අයත් මුහුදේ දී බව පිළිගෙන ඔවුන් ලිහිල්ව සලකන ලෙසට බලකර සිටිති. මෙවැනි අවස්ථාවලදී ඉන්දියානු පාර්ශවයන් නිදහසට කරුණක් ලෙස පවසන්නේ ඔවුන්ගේ යාත්‍රා බැරිවීමකින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මුහුදු සීමාව තුලට පැමිණි වහාම ශ්‍රී ලංකා නාවුක හමුදාව ඔවුන් අත් අඩංගුවට ගන්නා බවයි. බැරිවීමකින් පැමිණෙන අහිංසකයින් අත් අඩංගුවට ගැනීමේ චෝදනාවට අමතරව හිංසාකිරීමේ, පහරදීමේ පමණක් නොව සමහර ධීවරයින් මලවුන්ගේ අඩවියට ද යැවීමේ චෝදනා ද ඔව්හු නාවික හමුදාවට එල්ලකරති. තමිල්නාඩු ධීවරයන් අත් අඩංගුවට ගනු ලබන්නේ ශ්‍රී ලංකා මුහුදු සීමාව තුලදීම බවත්, සමහරවිට ශ්‍රී ලංකා වෙරළෙන් කිලෝ මීටර කිහිපයක් පමණක් ඔබ්බෙන් බවත්, චන්ද්‍රිකා ඡායාරූප සාක්ෂි ද සහිතව ශ්‍රී ලංකාව විසින් ඔප්පුකර පෙන්වූ විට, ඉන්දියානු පාර්ශවයෝ එතෙක් ගැයූ තනුව වෙනස් කරති; දෙරටේම ධීවරයින් චිරාත් කාලයක් තිස්සේ පෝක් මුහුදු බොක්ක ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ යෙදුනු බව ද, ඉන්දියානු ධීවරයනට සිය ප්‍රවේණිගත මුහුදු ප්‍රදේශවල සිය කර්මාන්තයේ යෙදෙන්නට අයිතියක් ඇති බව ද කියමින් මොරගසති. අවසානවරට ඉන්දියානු ධීවරයින් මෙරට අත් අඩංගුවට පත්වූයේ පසුගිය අප්‍රේල් මාසයේදීය. තමිල්නාඩුවේ අදහසට අනුව තමන්ගේ ප්‍රවේණිගත මුහුදු ප්‍රදේශවල ධීවර කර්මාන්තයේ යෙදුනු ධිවරයන් අත් අඩංගුවට ගන්නා පමණක් නොව ශ්‍රී ලංකාවේ අගමැතිවරයා ඔවුන්ට වෙඩි තබන බවට ද තර්ජනය කර ඇති බව පෙන්වා දී ඇත. එයින් ඔවුන් කෙතරම් කුපිතවූයේදැයි කිවහොත් ඉන්දීය ධීවරයනට ශ්‍රී ලංකාවෙන් සිදුවන දැඩි හිරිහැරවලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉන්දීය මධ්‍යම රජයට බලපෑම් කරනු ලැබින.

**නීතිමය ගිවිසුමෙන් අහෝසි වූ ප්‍රවේණිය**

තමිල්නාඩුව විසින් සඳහන් කරන ප්‍රවේණිගත මුහුදු ප්‍රදේශවල දෙරටේම ධීවරයන් සිය කර්මාන්තයේ යෙදුනේය යන කරුණ අසත්‍යයක් නොවේ. එහෙත් තමිල්නාඩු ධීවරයන් මෙන්ම දේශපාලකයින් ද සිහියට ගතයුතු කරුණක් ඇත. එනම්, 1974 වර්ෂයේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව, නාවුක ගිවිසුමක් අත්සන් කරමින් සිය මුහුදු සීමා මායිම් වෙන්කරගත් බවයි. මේ ගිවිසුමට අනුව කච්චතිව් දූපතේ පරම අයිතිය ශ්‍රී ලංකාව සතු බව ඉන්දියාව පිළිගත්තේය. අනෙක් අතට, ශතවර්ෂ ගණනාවක් තිස්සේ දෙරටේම තවත් ප්‍රවේණිගත ධීවර ප්‍රදේශයක් වූ වොජ් ඉවුරේ ධීවර කටයුතුවල යෙදීමේ අයිතිය එම ගිවිසුමට අනුව ඉන්දියාවට දෙනු ලැබින.

කෙසේවෙතත්, දෙරටේම ධීවරයින් විසින් භුක්ති විඳින ලද ප්‍රවේණිගත අයිතීන් 1974 අත්සන් කල ද්විපාර්ශවීය ගිවිසුමෙහි පිළිගෙන තිබින. එහෙත්, ශ්‍රී ලංකා මුහුදු සීමාවේ හොරෙන් මසුන් අල්ලන ඉන්දීය ධීවරයන් අත් අඩංගුවට පත්වූ අවස්ථාවලදී තමිල්නාඩු දේශපාලකයින් මධ්‍යම රජයට මතක් කිරීමට යුහුසුළුවන්නේ මේ අයිතීන්ය. මොවුන් එසේ කරන්නේ ගිවිසුමෙහි 4 වන කොන්දේසිය නොසලකා හරිමින් බව පෙනේ. එම කොන්දේසිය මෙසේ සඳහන් කරයි. පෝක් සමුද්‍ර සන්ධියෙහි සහ පෝක් මුහුදු බොක්කෙහි තම තමන්ගේ පැතිවල ජලය, දිවයින්, මහාද්වීපික තටාකය සහ යටිපස යන සියල්ලෙහි පරම අයිතිය ඒ ඒ පාර්ශවවලට හිමිය. ගිවිසුමෙහි 5 වන කොන්දේසියෙහි සඳහන්වන්නේ පෙර කොන්දේසියේ සඳහන් කරුණුවලට යටත්ව, මෙතෙක් සිදුකරන ලද පරිද්දෙන්ම ඉන්දීය ධීවරයන්ට සහ වන්දනාකරුවන්ට කච්චතිව් දූපතට ගොඩබැසීමට හැකි බවය. ඒ සඳහා වීසා හෝ වෙනත් ගමන් ලියකියැවිලි ශ්‍රී ලංකාව විසින් ඉල්ලා නොසිටිනු ඇත යනුවෙනි. සම්ප්‍රදායිකව සිදුකරන ලද පරිද්දෙන්ම එකිනෙකාට අයත් මුහුදේ ගමන්කිරීමට ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට අයත් යාත්‍රාවලට ඉඩ ලැබේ යනුවෙන් ගිවිසුමේ 6 වන කොන්දේසිය දක්වා සිටියි. කෙසේවෙතත්, මෙම 6 වැනි කොන්දේසිය මගින් පිළිගැනෙන්නේ එකිනෙකාට අයත් මුහුදු සීමාවන්හි යාත්‍රාකිරීමේ අයිතිය විනා ධීවර කටයුතු කිරීමේ අයිතිය නොවන වග සියළුදෙනා විසින්ම පැහැදිලිව වටහාගත යුතුය.

පෝක් සමුද්‍ර සන්ධියේ නාවුක කටයුතු පිළිබඳව 1974 වර්ෂයේ අත්සන් කල ගිවිසුමින් අනතුරුව 1976 දී ද දෙරට අතර තවත් නාවික ගිවිසුමක් ඇතිකරගන්නා ලදී. මන්නාරම් බොක්ක සහ බෙංගාල බොක්ක ප්‍රදේශවලට අදාලව දෙරටේ මුහුදු සීමාවන් සහ වෙනත් ආශ්‍රිත කරුණු මෙම ගිවිසුමින් ආවරණය විය. මෙම ගිවිසුම් ද්විත්වයෙන්ම සහ එවකට ඉන්දියාවේ විදේශ ලේකම්ව සිටි කේවාල් සිං සහ ශ්‍රී ලංකාවේ විදේශ ලේකම්ව සිටි ඩබ්ලිව් ටී ජයසිංහ මහතුන් විසින් අත්සන් කරන ලද ගිවිසුමට අදාල ලියවිල්ලෙන් පැහැදිලිව පෙනෙන්නේ දෙපාර්ශවයම එක මතයකට එකඟවූ බව සහ එක් පාර්ශවයට අයත් මුහුදේ ධීවර කටයුතු කිරීමට අනෙක් පාර්ශවයට කිසිසේත්ම අවසර දී නොමැති බවයි. ඉහත

ලියැවිල්ලේ 7 වන කොන්දේසියෙහි මෙසේ සඳහන්කර තිබේ. ඉන්දියාවට අයත් ධීවර යාත්‍රා හෝ ධීවරයන් හෝ ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව තුල හෝ එරටට පමණක් අයත් මුහුදු ආර්ථික කලාපය තුල ධීවර කටයුතු කිරීම සහ ශ්‍රී ලංකාවට අයත් ධීවර යාත්‍රා හෝ ධීවරයන් හෝ ඉන්දියාවේ මුහුදු සීමාව තුල හෝ එරටට පමණක් අයත් මුහුදු ආර්ථික කලාපය තුල, අදාල රටින් අවසරයක් නොලබා ධීවර කටයුතු කිරීමෙන් වැලකිය යුතුය.

**ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත බලෙන් පැහැරගැනීම**

ඓතිහාසික මුහුදු ප්‍රදේශවලට තමිල්නාඩු ධීවරයනට ඇති ප්‍රවේණිගත අයිතිය යනුවෙන් කුපිත කරවන සුළු තර්ක ඉදිරිපත්කිරීම, ශ්‍රී ලංකාවට අයත් ධීවර සම්පත් කොල්ලකෑම, නීතිවිරෝධී මසුන් ඇල්ලීම හරහා තමිල්නාඩු ධීවරයින් විසින් කරනු ලබන සාධාරණීකරණය කිරීම සඳහා යොදන කූට උපායකි. ඉන්දියානු මධ්‍යම රජය මේ සිද්ධියේ නීතිමය තත්වය හොඳින් දන්නා අතර තමිල්නාඩුව හා ශ්‍රී ලංකාව තුලනය කිරීමේ දුෂ්කර ක්‍රියාවක නවදිල්ලිය යෙදී ඇති බව පෙනේ. අගමැති මෝදි වෙත හිටපු මහ ඇමතිනි ජයලලිතා විසින් මෙම ගැටළුව සම්බන්ධයෙන් තද වචනයෙන් ලියා යවන ලද ලිපියට පිළිතුරු සපයන ලද්දේ විදේශ ඇමතිනි සුස්මා ස්වරාජ් විසිනි. එහි මෙසේ සඳහන්ය. "මේ ගැටළුවට ස්ථිරසාර විසඳුමක් සොයාගැනීම සඳහා මධ්‍යම රජය කැපවී සිටී. දැනට ශ්‍රී ලාංකික නිලධාරීන් සමග සාකච්ඡා පැවැත්වෙන අතර, දීර්ඝකාලීන විසඳුමක් ලබාගැනීම සඳහා අපි අර්ථවත් ලෙස කටයුතු කරමින් සිටිමු." මෙම ගැටළුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව නිවැරදි ලෙස ක්‍රියා කර නැතිනම්, ඉන්දීය මධ්‍යම රජයේ පිළිතුර මීට වඩා වෙනස් එකක් වනු ඇත.

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත් අඩංගුවට ගැනීම්, පහරදීම් සහ ඉඳහිට කෙරෙන වෙඩිතැබීම් වැනි චෝදනාවන් මධ්‍යයේ ඉන්දීය ධීවරයන් සතියට තෙවරක් ශ්‍රී ලංකා සීමාවට අයත් මුහුදු ප්‍රදේශයේ අන්තරායකාරී ගමනක යෙදෙමින් මසුන් ඇල්ලීමට හේතුව පැහැදිළිය. මසුන් අල්ලාගැනීමට 'බොටම් ට්‍රෝලින්' වැනි විනාශකාරී ක්‍රම යෙදීම නිසා ජාත්‍යන්තර මුහුදු සීමාවේ ඉන්දියාවට අයත් කොටස, මත්ස්‍ය සම්පතින් හිස්කරගෙන තිබේ. ඒ නිසා, ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශ කරා පැමිණ සිය විනාශකාරී ක්‍රමයන්ම භාවිතයේ යෙදෙමින් මසුන් ඇල්ලීමට ඔවුන් පෙළඹී ඇත. ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය ඉස්සන් ඇල්ලීම වුවත් භාවිත කරන ක්‍රමවේදයන්ගේ වරද නිසා මුහුදු පත්ල, බෙල්ලන්, මුතු බෙල්ලන්, මුහුදු කූඩැල්ලන් මෙන්ම කොරල් පර ද ඔවුන් අතින් විනාශ වේ. ජාත්‍යන්තරව තහනම් කර ඇති මාළු දැල් වර්ග භාවිත කරමින් ඔවුහු සිය වරද තවත් කිහිප ගුණයකින් වැඩිකරති.

පෝක් සමුද්‍ර බොක්කේ දවසේ ඕනෑම අවස්ථාවක බෝට්ටු 5000 කට ආසන්න සංඛ්‍යාවක් මසුන් ඇල්ලීමේ නිරතවන බව වාර්තාවේ. බෝට්ටු මෙතරම් විශාල සංඛ්‍යාවක් යොදාගනිමින් ඉන්දියානු ධීවරයින් සිදුකරන්නේ තිරසාර කටයුත්තක් නොවන බව දකින්නට විශේෂඥයකු වීම අනවශ්‍යය. දැනට සිදුවන පරිදි සතියකට දින 3 ක් ඉන්දියානු ධීවරයන් ශ්‍රී ලංකාවට අයත් මුහුදට බලහත්කාරයෙන් පැමිණ සුපුරුදු විනාශකාරී ක්‍රම යොදමින් මසුන් ඇල්ලීම නොකඩවා සිදු කළහොත් වැඩි කල් යන්නට මත්තෙන් එම ප්‍රදේශය ද මසුන්ගෙන් හිස්වී යනු නොඅනුමානය. ඉන්දියානු ධීවරයන් ජීවිකාව සඳහා වැටුපට වැඩකරන කම්කරුවන් වන අතර ඔවුන් පැමිණෙන යාත්‍රා තමිල්නාඩුවේ පොහොසත් ව්‍යාපාරිකයන් සතු බව වාර්තාවේ. මෙම ගැටළුව නිසා ඇතිවී ඇති පුදුම සහගත තත්වය නම් බලහත්කාරයෙන් පැමිණෙන ඉන්දීය ධීවරයින්ගේ තර්ජනයන්ට බියෙන්, ශ්‍රී ලාංකික ධීවරයින් සතියට දින තුනක් තමන්ට නීත්‍යානුකූලව අයත් මුහුදු සීමාවේ ධීවර කර්මාන්තයේ යෙදීමෙන් වැලකී සිටීමයි. මේ නිසා ඔවුන්ගේ ජීවිකා වෘත්තියට පහර වැදී තිබේ. යථාර්ථය මෙය හෙයින් ගැටළුව විසඳීම පිණිස මූලික පියවරගැනීමේ වගකීම ඉන්දීය රජය වෙත පවතී.

මේ සම්බන්ධයෙන් දශක ගණනාවක් පුරා පැවති සාකච්ඡාවලදී ඉන්දීය නිලධාරීහු සෑමවිටම ගැටළුව විසඳීම සඳහා තමන්ට තව කාලය ලබාදෙන ලෙස ශ්‍රී ලංකාවේ නිලධාරීන් වෙතින් ඉල්ලා සිටියහ. ජාත්‍යන්තර මුහුදු සීමාවේ ශ්‍රී ලංකා මායිමෙන් මෙපිටට පැමිණ මසුන් ඇල්ලීමට අවසර දෙමින් ඉන්දීය ධීවරයින්ට ශ්‍රී ලංකාවෙන් බලපත්‍රයක් නිකුත් කරන ලෙසද ඉල්ලීමක් කරනු ලැබින. බලපත්‍ර ක්‍රමයක් නිර්මාණය කරගන්නට බලවත් වෙහෙසක් දැරූ ඉහළ පෙළේ ඉන්දීය නිලධාරියෙක්, උතුරේ යුද්ධය පැවති සමයේ ශ්‍රී ලාංකික නිලධාරියකුට පවසා තිබුණේ ශ්‍රී ලංකාවට අයත් මුහුදේ මසුන් වයසට ගොස් මියයන බවයි . වෙනත් විකල්පයක් සොයාගන්නා තුරු බලපත්‍ර ක්‍රමයක් සකස්කිරීමේ යෝජනාව පළමුවෙන්ම ඉදිරිපත් වූයේ දශක එකහමාරකටත් වඩා එපිට කාලයකදීය. ඉන්දීය මධ්‍යම රජයට සහ තමිල්නාඩු රජයට සැබෑ අවශ්‍යතාවයක් වී නම්, ඔවුන්ගේ ධීවර ජනතාවගේ ජීවිකාව පිළිබඳ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් සොයන්නට එතෙක් මෙතෙක් ගතවූ කාලය හොඳටම සෑහේ.

**සිය රටේම තවත් ප්‍රාන්තයක් වන අන්ද්‍රා ප්‍රදේශයට අයත් මුහුදේ මසුන් ඇල්ලීමට තමිල්නාඩු ධීවරයින්ට අවසර නැත**

කෙසේවෙතත්, ඉන්දියාව විසින් දැන් දැන් මේ සම්බන්ධයෙන් සාධනීය පියවර අරඹා ඇතිබවක් පෙනෙන්නට තිබේ. අතිරික්ත ට්‍රෝලර් යාත්‍රා නැවත මිලදී ගෙන ඒවා ගැඹුරු මුහුදේ මසුන් අල්ලන යාත්‍රා බවට පරිවර්තනය කරන්නට ඉදිරිපත් කර ඇති යෝජනාව ඉන් එකකි. ඉන්දියාව තම ධීවරයින්ගේ ජීවිකා ගැටළුවට විසඳුමක් සොයා දෙනතුරුයැයි කියමින් සිය මුහුදු සීමාවට පැමිණ රිසිසේ මසුන් අල්ලාගෙන යාමට ඉන්දීය ධීවරයින්ට ඉඩ දී බලාසිටීම ශ්‍රී ලංකාව විසින් කිසිසේත්ම නොකළයුත්තකි. මෙම ගැටළුව අළලා ලියූ ලිපියක ඉන්දීය ආරක්ෂක අධ්‍යයන සහ විශ්ලේෂණ ආයතනයේ ගෞතම් සෙන් මෙසේ සඳහන් කරයි.

"තමිල්නාඩුවට යාබදව ඇති අළුතින් බිහිකරන ලද ආන්ද්‍රා ප්‍රදේශ් ප්‍රාන්තයට අයත් වෙරළාසන්න මුහුදේ නිදහසේ මසුන් ඇල්ලීමට තමිල්නාඩු ධීවරයන්ට අවසර නැත. ඔරිස්සා ප්‍රාන්ත මුහුදේ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් ආන්ද්‍රා ප්‍රදේශ් ධීවරයින්ට ද එවැනිම තහනමක් පවතී. ඉන්දීය ධීවරයෝ සාමාන්‍යයෙන් මෙවැනි සීමාවන් පිළිපදින්නෝය. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ මුහුද සම්බන්ධයෙන් ඔවුන් එසේ නොහැසිරීමට හේතුවක් නැත."

ඉන්දියාව සිය වගකීම ඉටුකරන්නට තැත් කරමින් පසුවෙද්දී, මේ ගැටළුවෙන් දුකට පත්ව ඇති සිය ධීවරයන්ගේ අයිතිවාසිකම් රැකදීම පිළිබඳව කටයුතු කරන්නට ශ්‍රී ලංකාව උත්සාහ දැරිය යුතුය.

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් යුද්ධයෙන් බොරදියක්ව පැවති අවදියේදී ඉන්දීය ධීවරයන්ට බාධාවක් නැතිව ලංකාවට අයත් මුහුදේ මාළු බාන්නට හැකිවිය. ආරක්ෂක හේතූන් මත ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ධීවරයින්ට මුහුදුයාම තහනම් කොට තිබීම එයට හේතුව විය. තමිල්නාඩු ධීවරයන්ට අවශ්‍යව ඇත්තේ තමන් ඒ කාලයේ ලැබූ වරප්‍රසාදය තවදුරටත් එසේම පවත්වා ගැනීමටය. යුද්ධය අවසන්වීමෙන් අනතුරුව, සිය ස්වභාවික සම්පත් ආරක්ෂා කරගැනීම පිණිස ශ්‍රී ලංකාව ගැටුම්වලට පෙර තිබූ නීතිරීතිවලට යළිත් අවතීර්ණවීම තමිල්නාඩු ධීවරයන්ගේ කෝපයට හේතුවී ඇත.

**නිරර්ථක උත්සාහය**

ගැටළුව සම්බන්ධයෙන් මනා අවබෝධයෙන් යුතුව සාකච්ඡා කර විසඳුමක් සොයාගැනීම පිණිස දෙරටේ ධීවර සංවිධානවලට පහසුකම් සැලසීම සම්පූර්ණයෙන්ම නිරර්ථක කටයුත්තකි. වසර ගණනාවකට පෙරද එවැනි උත්සාහයක් දැරූ අන්දම අපට මතක තිබේ. එහිදී, ඉන්දීය පාර්ශවයෙන් ශ්‍රී ලාංකික පාර්ශවයට ප්‍රබල පොරොන්දු රාශියක් ලබාදුන් නමුදු ඉන් එකක්වත් රකින්නට ඔවුන් උත්සාහ කලේ නැත. නැවතත් එවැනි ප්‍රයත්නයක් සිදුකළත්, නීති විරෝධී පන්න ක්‍රම යොදාගනිමින් ව්‍යසනකාරී ලෙස ශ්‍රී ලංකා මුහුදේ බලාත්කාරයෙන් මසුන් අල්ලන බව පිළිගැනීමට ඔවුනට නුපුළුවන. ඒ වෙනුවට ඔවුන් කරනු ඇත්තේ සතියට කිහිපවරක් ශ්‍රී ලංකාවේ සීමාවට පැමිණ මසුන් ඇල්ලීමේ අවසරය ඉල්ලා එය ක්‍රමයෙන් නැවැත්වීම පිණිස වසර ගණනාවක කාලයක් ද ඉල්ලීමයි. මේ වසර කිහිපය ඇතුලත වෙරළට කිලෝ මීටර 3-4 ක් ආසන්න වනතුරු පැමිණ තහනම් දැල්පන්න සහ බොටම් ට්‍රෝලින් යොදාගනිමින් හැකිතරම් මසුන් ඇල්ලීම ඔවුන්ගේ යටි අරමුණ වන අතර, මෙය ශ්‍රී ලංකාවට කිසිසේත්ම පිළිගතහැකි කොන්දේසියක් නොවේ. ඉන්දියානු ධීවර යාත්‍රා අත්අඩංගුවට ගැනීම ද, ඒ සම්බන්ධයෙන් තමිල්නාඩු ධීවර උද්ඝෝෂණ ඇතිවීමෙන් අනතුරුව ඒවා නිදහස් කිරීම ද, මෙම බලහත්කාර ක්‍රියාවන් වලින් ඔවුන් වලක්වන්නට ප්‍රමාණවත් පියවරක් නොවේ. යාත්‍රා කිහිපයක් අත්අඩංගුවට ගත්ත ද, තවත් යාත්‍රා දහස් ගණනක් ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව ඇතුලත බලහත්කාරයෙන් මසුන් ඇල්ලීමේ යෙදෙනු ඇත.

**ගතයුතු පියවර සම්බන්ධ නිර්දේශ**

මෙම ගැටළුව විසඳාගැනීම උදෙසා ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව තිබේ. එකක් නම් අත්අඩංගුවට ගන්නා යාත්‍රාවල ඇති තහනම් වර්ගයේ දැල් රාජසන්තක කර විනාශ කරදැමීමයි. ධීවර යාත්‍රා ද රාජසන්තක කිරීම හෝ ඒ වෙනුවට විශාල දඩවලට යටත්ව හෝ නිදහස් කළහැකිය. මෙවැනි ක්‍රියාමාර්ගයන් තුලින් අපේක්ෂා කෙරෙනුයේ වෙනත් රටක මුහුදු සීමාවක මසුන් ඇල්ලීම දඬුවමට යටත් වියයුතු නීති විරෝධී ක්‍රියාවක් බව ඔවුනට තහවුරු කිරීමයි. කෙසේවෙතත්, මෙවැනි පියවර තමිල්නාඩු ධීවර උද්ඝෝෂණ, මාධ්‍යවලින් විශාල ලෙස ප්‍රචාරය ලබාදීම, මෙන්ම ශ්‍රී ලංකාවට එරෙහිව දැඩි පියවර ගන්නා ලෙස තමිල්නාඩු දේශපාලකයින් මධ්‍යම රජයට බලකිරීම වැනි ප්‍රතිපල උදාකරනු ඇත. අනෙක් අතට, අරාබි මුහුද දෙසට යාත්‍රා කරනු පිණිස ඉන්දියාවට අයත් මුහුදු ප්‍රදේශය හරහා යන්නට තැත්කරන ශ්‍රී ලාංකික ධීවරයින් ඉන්දියාව විසින් අත්අඩංගුවට ගනු ඇති අතර අන්තිමට සිදුවනු ඇත්තේ දෙරට තම තමන්ගේ අත් අඩංගුවේ සිටින ධීවරයින් හුවමාරු කරගැනීමේ තත්වයක් ඇතිවීමයි. මෙවැනි වාතාවරණයක් යටතේ ශ්‍රී ලංකාවට කළහැකිවන්නේ තමිල්නාඩු ආණ්ඩුව හසුරුවාගැනීම සඳහා මධ්‍යම රජය එකඟකරවා ගැනීමයි.

මේ සඳහා කෙරෙන සාකච්ඡාවලදී, තත්වය පාලනය කරන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ට අමතර කාලයක් අවශ්‍යවන බව ඉන්දියානු පාර්ශවය කියනු නියතය. එතෙක්, වසර ගණනාවක් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ සුපුරුදු පරිදි ධීවර කටයුතු කරගෙන යාමට තමිල්නාඩු ධීවරයිනට අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනු නියතය.

එවන් තත්වයක් ඇතිවීම කිසිසේත් වැලැක්වීමට නොහැකි නම්, ශ්‍රී ලංකාව කළයුත්තේ එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට දෙනු ලබන අවසර කාලය අවම කර ශ්‍රී ලංකා මුහුදු ප්‍රදේශයට පැමිණීමට අවසර දෙන ඉන්දියානු යාත්‍රා සංඛ්‍යාව ද සීමාකිරීමය. එමෙන්ම ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවෙන් මෙපිටට තමිල්නාඩු යාත්‍රාවලට පැමිණීමට අවසර ඇති දින ගණන ද සීමාකිරීම, අවශ්‍ය වේ. කෙසේවෙතත්, තහනම් වර්ගයේ දැල් පාවිච්චිකිරීම සහ විනාශකාරී බොටම් ට්‍රෝලින් සිදුකිරීම සම්බන්ධයෙන් කිසිදු ආකාරයක ලිහිල්බවක් නොදැක්විය යුතුය.

කෙටි කාලයක් සඳහා වුව ද මේ ආකාරයේ වැඩපිළිවෙලකට ශ්‍රී ලංකාව එකඟවීම උතුරුකරයේ ධීවරයින්ගේ නොසතුටට හේතුවන බවට සැක නැත. ඔවුන් ඊට එරෙහිව උද්ඝෝෂණය කරනු ඇත. එබැවින්, ඔවුනට සිදුවන ආර්ථික පාඩුව වෙනුවෙන් තමිල්නාඩු ධීවරයින් විසින් නෙලාගන්නා මත්ස්‍ය අස්වැන්නේ ප්‍රමාණයට සරිලන වටිනාකමක් ගෙවීමට එකඟ වීමට ඉන්දියාව එකඟකරවා ගැනීමට සමහරවිට ශ්‍රී ලංකාවට හැකිවනු ඇත.

ශ්‍රී ලංකාවට මෙයින් සිදුවන පාඩුව මගහරවා ගැනීමේ තවත් ක්‍රම තිබේ. පෝක් බොක්කේ ශ්‍රී ලංකාවට අයත් ප්‍රදේශයේ තමිල්නාඩු ධීවරයින් මාළු අල්ලන කාලසීමාවට සමාන කාලසීමාවක් ඉන්දියානු ආර්ථික මුහුදු කලාපයේ ධීවර කටයුතු කිරීමට ශ්‍රී ලංකාවේ ධීවරයිනට ඉඩදිය යුතුය යන කොන්දේසිය ඉදිරිපත් කළහැකිය. ඉන්දියානු රජයෙන් නිසිපරිදි අවසර ලබාගත් ශ්‍රී ලාංකික ධීවර යාත්‍රාවලට වසර තුනක කාලයක් වොජ් ඉවුරේ ධීවර කටයුතු සිදුකිරීමට දෙරට අතර 1976 දී දෙරටේ විදේශ කටයුතු ලේකම්වරුන් විසින් කරන ලද ලිපිහුවමාරුවේ මෙසේ ප්‍රතිපාදන සලසා තිබින. "ශ්‍රී ලාංකික ධීවර යාත්‍රා සංඛ්‍යාව 6 නොඉක්මවිය යුතු අතර වොජ් ඉවුරෙන් ඔවුන් අල්ලාගන්නා මත්ස්‍ය ප්‍රමාණය වසරකට ටොන් 200 නොඉක්මවිය යුතුය. මෙම කාලසීමාව ඉකුත්වීමෙන් පසුව වොජ් ඉවුරේ මසුන් ඇල්ලීම ශ්‍රී ලාංකික යාත්‍රාවලට ඉඩ නොලැබේ."

සීමිත කාල පරිච්ඡේදයන් සඳහා මීට සමාන එකඟත්වයකට එළැඹීමේ හැකියාව ඇත. තමිල්නාඩු ධීවර යාත්‍රා සීමිත සංඛ්‍යාවකට, සීමිත කාලයක් තුළ, ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවෙන් මෙපිට මසුන් ඇල්ලීමට අවසර ලබාදීම නිසා අහිමිවන ආදායම මේ ආකාරයෙන් පියවා ගතහැකිවනු ඇත. එහෙත්, දීර්ඝකාලීන පරමාර්ථය වියයුත්තේ තමිල්නාඩු ධීවරයන් ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවෙන් මෙපිටට පැමිණ හොරෙන් මසුන් ඇල්ලීම සපුරා නවත්වාගැනීමය. මේ පරමාර්ථය ඉටුකර ගතහැකි එක් ක්‍රමයක් වන්නේ ඉන්දියා/පාකිස්ථාන මුහුදු සීමාවේ ගුජරාට් ප්‍රාන්තයට අයත් මුහුදේ පවතින පරිදි, සීමාවෙන් දෙපැත්තේම කිලෝ මීටර් 3 ක දුරක කිසිවකුට ධීවර කර්මාන්තයේ යෙදිය නොහැකි තහනම් කලාපයක් නිර්මාණය කරගැනීමය.

අනුන්ගේ මුහුදු සීමා උල්ලංඝනය කරමින් සිය ධීවරයින්ට හොරෙන් මසුන් ඇල්ලීමේ කටයුතුවල යෙදීමට ඉඩහැර බලාසිටීම සහ අවසර සහිතව අනෙක් රටවල මුහුදු ප්‍රදේශවල මසුන් ඇල්ලීම සඳහා බලපෑම් ඉදිරිපත් කරනු වෙනුවට, දශක ගණනාවක් ඇදෙමින් යන්නට නොදී මේ ගැටළුව විසඳන්නට ඉන්දීය බලාධිකාරීන්ට හැකියාව තිබින. කෙසේවුවත්, දැන් උතුරුකරයේ ධීවරයින් මේ ගැටළුව සියතට ගෙන ඇති අතර, එහි ප්‍රතිපලයක් ලෙස, උතුරු පළාත්සභාවේ අධිකාරීන් ගැටළුවෙන් බලපෑම් ඇතිවූ ධීවරයින් වෙනුවෙන් ක්‍රියාකරන්නට ඉදිරිපත්වී තිබේ. එබැවින්, ජාත්‍යන්තර බේරුම්කරණයක් සොයායන්නට ශ්‍රී ලංකාව තල්ලුකිරීමෙන් තොරව තිරසාර විසඳුමක් සොයාගැනීමේ අරමුණ ඇතිව ගැටළුවට විසඳුම් සෙවීමේ ක්‍රියාවලියකට අවතීර්ණවන්නට දෙරටටම කාලය පැමිණ තිබේ.

අසල්වැසි රටවල් අතර හිතෛෂීභාවය සාධාරණව හිතාබලා ක්‍රියාකිරීමේ අවස්ථාව ඇති කළයුතු අතර වැඩි ශක්තියක් නැති කුඩා රටකට සිය ස්වභාවික සම්පත් ආරක්ෂා කරගැනීමට අවකාශ යුතුය.

ඔබේ අදහස් අපි අගය කොට සලකමු.

www.pathfinderfoundation.org / pm@pathfinderfoundation.org